# සිව්වැනි කොටස

## මහ බැංකුවේ හා ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාල

## 1983 ප්‍රධාන නීති අනපනත්

පිටුව


1. 1983 අංක 15 දරන විසර්ජන පනත ... I

2. 1983 අංක 21 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා (සංශෝධන) පනත ... IV

3. 1983 අංක 39 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත ... IV

4. 1983 අංක 43 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත ... VIII

5. 1983 අංක 51 දරන ලියාපදිංචි කළ ස්කන්ධ හා සුරැකුම් පත් (සංශෝධන) පනත ... XIV

6. 1983 අංක 52 දරන විසර්ජන පනත ... XV

7. 1983 අංක 53 දරන පුනරුත්ථාපන බදු පනත ... XVII

## 1983 අංක 15 දරන විසර්ජන පනත

**[සහතිකය සටහන් කළේ 1983 අප්‍රේල් මස 20 වන දින]**

**1983 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීමත්, එම සේවා වියදම් සඳහා ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් හෝ ණය ලබා ගැනීමට බලය දීමත්, ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ යම් යම් කටයුතු වෙනුවෙන් මුදල් සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1983 අංක 15 දරණ විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (1) යම් මුදලක් වැය කිරීමට බලය දෙන්නාවූ අන්කිසි නීතියකට හානියක් නොමැතිව, මේ පනතෙහි '' 1983 මුදල් වර්ෂය '' යනුවෙන් සඳහන් කරනු ලබන 1983 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව 1983 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යයි තක්සේරු කර ඇති රුපියල් තුන්දහස් අටසිය පනස් හත්කෝටි අනූ අට ලක්ෂ හතළිස් එක් දහසක් වූ ආණ්ඩුවේ වියදම—

(අ) ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම් වලින්; හා

(ආ) ණය වශයෙන් ලබා ගන්නා මුදල්වල සමස්තය රුපියල් දෙදහස් පන්සිය තිස් හත් කෝටි අසූ ලක්ෂයක් නොඉක්මවන සේ ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් හෝ ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල්වලින්

පියවිය යුතුය.

මෙහි ඉහත සඳහන් කළ රුපියල් තුන්දහස් අටසිය පනස්හත් කෝටි අනූඅට ලක්ෂ හතළිස් එක්දහසක් වූ මුදල මේ පනතේ පළමුවන උප ලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකි ය.

(2) මේ වගන්තියේ (1) වන උප වගන්තියෙහි විධිවිධාන, ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ණය ලබා ගැනීමට බලය දෙනු ලබන අන්කිසි ලිඛිත නීතියක විධිවිධානවලට හානියක් නොමැතිව බල පැවැත්විය යුතු ය.

**3.** (1) 1983 මුදල් වර්ෂය තුළ දී, මෙම පනතෙහි දෙවන උප ලේඛනයෙහි I වන තීරයෙහි දක්වෙන කටයුත්තකින් ආණ්ඩුවට ලැබෙන ලැබීම් එම කටයුත්තේ ගිණුමට බැර කළ යුතු අතර, එසේ බැර කරනු ලැබූ ලැබීම්වල සමස්තය එම උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනෙහි දක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතු ය. එවැනි කටයුත්තකින් ලබන ශුද්ධ අතිරික්තයක් වේ නම්, පහත දක්වෙන ගෙවීම සඳහා වූ එවැනි කටයුත්තක ආදයමින් අඩු කිරීමෙන් පසුව, එනම් :—

(අ) කිසියම් කටයුත්තක ආදායම අයවිය යුතුව, නිසි අයුරින් ගෙවනු ලැබූ හෝ උපචිත වූ එම කටයුත්තේ කාර්ය සාධන, සංස්ථාපන හා වෙනත් වියදම් ; සහ

(ආ) කිසියම් කටයුත්තක නිශ්චල හා චංචල දේපළ වෙනුවෙන් ක්ෂයවීම ආවරණය සඳහා ප්‍රතිපාදන

1983 මුදල් වර්ෂය අවසන් වී හය මාසයක් ඉකුත් වීමට පෙර ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු ය.

(2) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 1983 මුදල් වර්ෂය තුළ ආණ්ඩුව විසින් දරනු ලබන වියදම්, ඒ මුදල් වර්ෂය තුළදී එම කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම් වලින් ගෙවිය යුතු ය. එහෙත් එම වියදම් එම උපලේඛනයේ II වන තීරයෙහි අනුරූප සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

(3) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන කිසියම් කටයුත්තක් සම්බන්ධයෙන්, 1983 මුදල් වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය, එම උපලේඛනයේ IV වන තීරයෙහි අනුරූප සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය. තවද, ඒ මුදල් වර්ෂයේ අවසානයේ දී එම කටයුත්තේ මුළු බැරකම්, එම උපලේඛනයේ V වන තීරයෙහි අනුරූප සටහනේ දැක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

4. 1983 මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දැක්වෙන යම් කටයුත්තකින් ආණ්ඩුවට ලැබෙන ලැබීම්, ඒ කටයුත්ත සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, එම වියදම් පියවීම සඳහා අමාත්‍යවරයා අවශ්‍ය යයි සලකන මුදල් ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කරනු ලැබිය හැකිය. එහෙත් එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල සමස්තය එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ දැක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතු ය. එකී කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක් අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවිය යුතු ය.

5. (1) යථෝක්ත උපලේඛනයේ සඳහන් කිසියම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම්කිසි වැඩ සටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම්වලට මේ පනතේ පළමුවන උපලේඛනයෙහි විධිවිධාන ප්‍රකාර, වෙන් කරනු ලැබුවාවූ ද, එහෙත් වියදම් නොකරන ලද්දා වූ හෝ මතුවට වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තු විය හැකි වූ ද, යම් මුදලක් එම වැඩ සටහනේම මූලධන වියදමේ වෙන්කිරීමකට හෝ එම ශීර්ෂයේම වෙන යම් වැඩ සටහනක් යටතේ පුනරාවර්තන වියදමේ හෝ මූලධන වියදමේ හෝ වෙන් කිරීමකට හෝ භාණ්ඩාගාරයේ ලේකම්ගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයෙකුගේ හෝ නියමය අනුව මාරු කළ හැකි ය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයෙහි සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ මූලධන වියදමට වෙන් කරන ලද කිසිම මුදලක් ඒ වෙන් කිරීමෙන් පිටතට මාරු කරනු නොලැබිය යුතු ය.

6. (1) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදු වලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම්, බලාපොරොත්තු වූ මුදල්වලට වඩා අඩු විය හැකි බවට ; හෝ

(2) යම්කිසි කාර්යයක් හෝ කාර්යයන් සඳහා මුදලින් විසර්ජිත මුදල් තවදුරටත් අවශ්‍ය නොවන බවට

අමාත්‍යවරයා සෑහීමකට පත් වූ අවස්ථාවක, ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදාහරින ලද මුදල් සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ ඉවත් කර ගැනීම අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමතය ඇතිව කරනු ලැබිය හැකි ය.

7. මේ පනතේ දෙවන උපලේඛනයේ II වන තීරයෙහි, IV වන තීරයෙහි හෝ V වන තීරයෙහි දැක්වෙන යම් උපරිම සීමාවක් හෝ III වන තීරයෙහි දැක්වෙන අවම සීමාව හෝ ආණ්ඩුවේ අනුමතය ඇතිව 1984 මැයි මස 31 වන දින හෝ ඊට පෙර අමාත්‍යවරයා විසින් නියමයක් මගින් වෙනස් කරනු ලැබිය හැකිය. නැතහොත් අමුතු කරනු ලැබිය හැකිය. එබඳු යම් නියමයක් , එහි එසේ ප්‍රකාශිතවම සඳහන් කරනු ලැබුවහොත්, ඒ නියමය කරනු ලැබූ දිනයට කලින් වූ සහ එහි අක්වනු ලබන දිනයක සිට බලපැවැත්වූ ලෙස සැලකිය යුතු ය.

8. මේ පනතේ දෙවන උපලේඛනයෙහි උචිත තීරවලට යම් කටයුත්තක් හා ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ සියළුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක් හෝ අවම සීමාව හෝ එකතු කිරීමෙන් පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකි ය.

9. 1983 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව මේ පනත ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයෙහි අවසන්වන කාලයෙහි සේවය සඳහා මුදල් ප්‍රතිපාදන සලස්වන 1982 නොවැම්බර් මස 2 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ යෝජනාවෙහි සඳහන් කිසිවක් ගැන නොසලකා—

(අ) ඒ යෝජනාවෙහි පළමුවන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් යම් ශීර්ෂයක් යටතේ දැක්වෙන යම් වැඩ සටහනකට ඒ යෝජනාව මගින් වෙන් කරනු ලැබූ මුදල් වලින් ඒ කාලය තුළදී වියදම් කරනු ලැබූ යම් මුදල් ප්‍රමාණයක්, ඒ යෝජනාවෙහි බලය යටතේ වියදම් කර ඇති ලෙස නොව මේ පනතෙහි බලය යටතේ වියදම් කර ඇති ලෙස සියලු කාර්යයන් සඳහා සැලකිය යුතු ය ;

(ආ) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි වියදම් නොකර ඇති එසේ වෙන් කරනු ලැබූ යම් මුදල් ප්‍රමාණයක්, මේ පනත යටතේ වූ අනුරූප ශීර්ෂය යටතේ දැක්වෙන අනුරූප වැඩ සටහනකට වෙන් කරනු ලැබූ මුදල් වලට ඇතුළත් කරනු ලැබූ ලෙස සියලු කාර්යයන් සඳහා සැලකිය යුතු ය ; තවද

(ඇ) ඒ යෝජනාවෙහි දෙවන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් සේවයන් සම්බන්ධයෙන් 1983 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව මේ පනත ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයෙහි අවසන් වන කාලය තුළ දී ඒකාබද්ධ අරමුදලින් අත්තිකාරම් වශයෙන් ගෙවනු ලැබූ යම් මුදල් ප්‍රමාණයක්, ඒ යෝජනාවේ බලය යටතේ අත්තිකාරම් වශයෙන් එසේ ගෙවා ඇති ලෙස නොව මේ පනතෙහි බලය යටතේ අත්තිකාරම් වශයෙන් එසේ ගෙවා ඇති ලෙස සියලු කාර්යයන් සඳහා සැලකිය යුතු ය.

## 1983 අංක 21 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 1983 ජූනි මස 23 වන දින]**

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1983 අංක 21 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 14 වන වගන්තිය එම වගන්තියේ (1) වන උප වගන්තියේ දැක්වෙන '' සලකන දෙපාර්තමේන්තු'' යන වචන වෙනුවට '' සලකන දෙපාර්තමේන්තු හෝ නියෝජිතායතන '' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**3.** 1980 අංක 43 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (1) වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(අ) '' ඇ උපලේඛනයෙහි '' යන යෙදුම වෙනුවට '' ඇ උපලේඛනයෙහි හෝ ඈ උපලේඛනයෙහි '' යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(ආ) '' තුළම බලාත්මක විය යුතුය.'' යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

'' තුළම බලාත්මක විය යුතු ය :

එසේ වුවද කොමිෂන් සභාව විසින් 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ කිසිම අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක්, නියමයක් හෝ නිවේදනයක් සෑදීම හෝ නිකුත් කිරීම හෝ ඒ පනත යටතේ යම් බලයක් හෝ කර්තව්‍යයක් කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම ඒ පනතින් පිහිටුවන ලද මධ්‍යම පාරිසරික අධිකාරියේ අදහස් විමසීමෙන් පසු සහ එහි එකඟත්වය ඇතිව මිස කරනු නොලැබිය යුතු ය. ''.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (2) වන උප වගන්තිය එහි දැක්වෙන '' අවුරුදු පහක '' යන වචන වෙනුවට '' අවුරුදු තුනක '' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**5.** පහත දැක්වෙන අලුත් උපලේඛනය ඇ උපලේඛනයට ඉක්බිතිවම එකතු කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කෙරෙන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ ඈ උපලේඛනය ලෙස බලාත්මක විය යුතු ය :—

## 1983 අංක 39 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 1983 ඔක්තෝබර් මස 07 වන දින]**

**1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1983 අංක 39 දරන පිරිවැටුම් බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින් මතු '' ප්‍රධාන ප්‍රඥප්තිය '' යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ 10 වන වගන්තියේ '' මේ පනතේ කාර්ය සඳහා ගෙවීම පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතුය. '' යන වචන වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' මේ පනතේ කාර්යය සඳහා ගෙවීම පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතුය :

එසේ වුව ද, කලින් කාර්තුවක් සඳහා වූ යම් ව්‍යාපාරයක පිරිවැටුම රුපියල් එක්කෝටි පනස් ලක්ෂය ඉක්මවන අවස්ථාවක, පසුව එළඹෙන කාර්තුව සඳහා ගෙවිය යුතු වන පිරිවැටුම් බද්ද පහත දක්වෙන ආකාරයට ගෙවනු ලැබිය යුතු ය :—

(අ) කලින් කාර්තුව සඳහා ගෙවිය යුතු වන පිරිවැටුම් බද්දෙන් තුනෙන් එකක්, පසුව එළඹෙන කාර්තුවේ දෙවන මාසයේ පහළොස්වන දින පසු නොවී ගෙවනු ලැබිය යුතු ය ;

(ආ) කලින් කාර්තුව සඳහා ගෙවිය යුතු වන පිරිවැටුම් බද්දෙන් තුනෙන් එකක්, පසුව එළඹෙන කාර්තුවේ තුන්වන මාසයේ පහළොස්වන දින හෝ ඊට පෙර ගෙවනු ලැබිය යුතු ය ;

(ඇ) පසුව එළඹෙන කාර්තුව සඳහා ගෙවිය යුතු වන පිරිවැටුම් බද්ද, එයින්, (අ) ඡේදය හා (ආ) ඡේදය යටතේ ගෙවන ලද මුදල් අඩු කිරීමෙන් පසු. එම කාර්තුව අවසානයේ එළඹෙන මාසයේ පහළොස්වන දින පසු නොවී ගෙවනු ලැබිය යුතු ය.

එසේ නොගෙවන ලද යම් බද්දක් ගෙවීම පැහැර හරින ලද බද්දක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ බද්ද ගෙවනු ලැබිය යුත්තේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා හෝ ඒ බද්ද එක් තැනැත්තකුට වැඩි දෙනකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ ගෙවිය යුතුව ඇති අවස්ථාවක, ඒ තැනැත්තන්ගෙන් එක් එක් තැනැත්තා සහ හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරු මේ පනතේ කාර්ය සඳහා ගෙවීම පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.''.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියෙහි '' මේ වගන්තියේ '' යන වචනවලින් ආරම්භ වී ඒ වගන්තියේ කෙළවර තෙක් වූ සියලුම වචන වෙනුවට, පහත දක්වෙන කොටස ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

'' මේ වගන්තියේ කුමක් සඳහන් වුව ද, විවිධ වර්ගවල හෝ විස්තරවල ව්‍යාපාර සම්බන්ධයෙන් ගනුදෙනු වාර්තාගත කරනු ලැබිය හැක්කේ යම් ආකෘතියක් හා ආකාරයක් අනුව ද ඒ ආකෘතිය හා ආකාරය, එම වර්ගයේ හෝ විස්තරයේ යම් ව්‍යාපාරයක ස්වභාවය සැළකිල්ලට ගනිමින්, කොමසාරිස් ජනරාල් වරයා විසින් නියම කරනු ලැබිය හැකි ය. ව්‍යාපාරයක ගනුදෙනු වාර්තාගතකරනු ලැබිය යුතු ආකෘතිය හා ආකාරය කොමසාරිස් ජනරාල් වරයා විසින් නියම කරනු ලැබ ඇති අවස්ථාවක, පිරිවැටුම් බද්ද අයකරනු ලැබිය යුතු වූ ද ඒ ව්‍යාපාරය කරගෙන යනු ලබන්නාවූ ද සෑම තැනැත්තකු විසින් ම, ඒ ව්‍යාපාරය කරගෙන යාමේ දී තමා ඇතුළත් වූ එක් එක් හා සෑම ගනුදෙනුවක්ම නියමිත ආකෘතියෙහි සහ ආකාරයට වාර්තාගත කිරීම හෝ වාර්තාගත කිරීමට සැලැස්වීම කරනු ලැබිය යුතු ය. එම වාර්තාව පිළියෙළ කරන ලද්දේ යම් තැනැත්තකු විසින් ද නැතහොත් යම් තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තා විසින්, එම වාර්තාව පිළියෙළ කරන ලද්දේ යම් කාර්තුවක් සම්බන්ධයෙන් ද එම කාර්තුව ඉකුත්වීමෙන් පසුව අවුරුදු පහක කාලයක් රඳවා තබා ගැනීම හා ආරක්ෂා කිරීම කරනු ලැබිය යුතු ය. ''.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ (2) වන උප වගන්තිය—

(1) ඒ උප වගන්තියෙහි '' තම ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා ඒ බද්ද ගෙවිය යුතු වන්නා වූ හා එළඹුන '' යන වචන වෙනුවට, '' තම ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා ඒ බද්ද ගෙවිය යුතු වන්නා වූ හා වෙනත් ලියා පදිංචි කළ සාදන්නකු සමග එළඹුන '' යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ ;

(2) ඒ උප වගන්තියෙහි (ඉ) සහ (ඊ) ඡේද වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (ඉ) පිරිවැටුම් බද්ද සඳහා යම් අයකිරීමක් කිරීමට පෙර, එක් එක් ගනුදෙනුව සම්බන්ධයෙන් සපයන ලද භාණ්ඩ ප්‍රමාණය සහ ලැබුණු හෝ ලැබිය හැකි මුදල් ප්‍රමාණය ;

(ඊ) විකුණනු ලබන අවස්ථාවේ දී පමණක් ඒ එක් එක් ගනුදෙනුවකට ආරෝපණය කළ හැකි පිරිවැටුම් බද්ද ; සහ

(උ) තමා විසින් ආනයනය කරන ලද්දා වූ ද යම් ක්‍රියා වලියකට යටත් නොකර විකුණන ලද්දා වූ ද භාණ්ඩයකට ගනුදෙනුව අදාල වන්නා වූ අවස්ථාවක, ඒ ගනුදෙනුවෙන් ආවරණය වන භාණ්ඩ වලට ආරෝපණය කළ හැකි ප්‍රධාන රේගු අයකැමි වෙත ගෙවන ලද පිරිවැටුම් බදු ප්‍රමාණය. ".

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තියේ " එහෙත් එය තදනන්තර කාර්තුව සඳහා ගෙවිය යුතු බද්දෙන් අඩු කරනු ලබන අතර සෙස්ස එපරිද්දෙන්ම විය යුතු ය." යන වචන වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" එහෙත් එය තදනන්තර කාර්තුව සඳහා ගෙවිය යුතු බද්දෙන් අඩු කරනු ලබන අතර සෙස්ස එපරිද්දෙන් ම විය යුතු ය ;

එසේ වුව ද—

(අ) එම ව්‍යාපාරයේදී පාවිච්චි කරනු ලැබූ යම් පිරියතක්, යන්ත්‍රෝපකරණයක්, තිරවුරු, ගොඩනැගිලි, වාහන හෝ වෙනත් මූලධන වත්කම් සම්බන්ධයෙන් වූ බදු සඳහා අඩු කිරීමක් නොකළ යුතු ය ;

(ආ) 4 වන වගන්තිය යටතේ පිරිවැටුම් බද්දෙන් නිදහස් කළ යම් ව්‍යාපාරයක දී පාවිච්චි කරනු ලැබූ හෝ බද්දෙන් නිදහස් කළ භාණ්ඩ සෑදීමේදී පාවිච්චි කරනු ලැබූ භාණ්ඩ සම්බන්ධයෙන් කවර වූ හෝ අඩු කිරීමක් නොකළ යුතු ය ; තව ද

(ඇ) ශ්‍රී ලංකාවෙන් බැහැරව සාදන ලද යම් භාණ්ඩයක් ආනයනය කරන්නාවූ ද යම් සෑදීමේ ක්‍රියාවලියකට යටත් නොකොට ඒ භාණ්ඩය විකුණන්නා වූ ද කවර වූ හෝ තැනැත්තකු, මේ පනතේ වෙනත් යම් විධිවිධාන වල කුමක් සඳහන් වුව ද, 1983 පෙබරවාරි මස 19 වන දින හෝ ඉන් පසුව මේ වගන්තියේ කාර්ය සඳහා සාදන්නකු වශයෙන් සලකනු නොලැබිය යුතු ය. ".

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (3) වන උප වගන්තියෙහි

" (6) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව " යන යෙදුම් වෙනුවට, "(5) වන උප වගන්තියේ සහ (6) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව " යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ, (4) වන උපවගන්තිය වෙනුවට, පහත දැක්වෙන අළුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

'' (4) (5) වන උපවගන්තියේ සහ (6) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ශ්‍රී ලංකාවේ දී සාදන ලද හෝ නිපදවන ලද යම් භාණ්ඩයක සාදන්නා හෝ නිපදවන්නා අපනයනකරු ම බවට, සහ

(i) තමා විසින් අපනයන කරනු ලබන භාණ්ඩ සෑදීමේදී ඒ අපනයනකරු විසින් උපයෝගී කරගන්නා ලද ඒ අමු ද්‍රව්‍ය සම්බන්ධයෙන් වූ පිරිවැටුම් බද්ද අපනයන- කරු විසින් ප්‍රධාන රේගු අයකැමි වෙත ඇත්ත වශයෙන් ම ගෙවන ලද බවට, හෝ

(ii) (අ) ඒ භාණ්ඩය සෑදීමට හෝ නිපදවීමට උපයෝගී කර ගනු ලැබුවේ යයි සැලකෙන ඒ අමුද්‍රව්‍ය මිලට ගැනීම සඳහා ඒ අපනයනකරු විසින් ගෙවන ලද මිල, ඒ අමු ද්‍රව්‍ය මිලට ගනු ලැබුවේ යම් සාදන්නකුගෙන් හෝ නිපදවන්නකුගෙන් ද ඒ සාදන්නාට හෝ නිපදවන්නාට ගෙවන ලද බවට, සහ

(ආ) ඒ අමු ද්‍රව්‍ය වලට ආරෝපනය කරනු ලැබිය හැකි තම ව්‍යාපාරයේ පිරිවැටුම සම්බන්ධයෙන් වූ පිරිවැටුම් බද්ද ඒ අමුද්‍රව්‍ය සාදන්නා හෝ නිපදවන්නා විසින් ඇත්තවශයෙන්ම ගෙවන ලද බවට

කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ භාණ්ඩය සෑදීමේ දී හෝ නිපදවීමෙහි දී උපයෝගී කරන ලද අමු ද්‍රව්‍යවලට ආරෝපණය කරනු ලැබිය හැකි පිරිවැටුම් බද්දේ මුදල් ප්‍රමාණය කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ අපනයනකරුට ගෙවනු ලැබිය යුතු ය.'' ;

(3) ඒ වගන්තියේ (5) වන උප වගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

'' (5) (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධාන—

(අ) යම් කාලයක් සඳහා පිරිවැටුම් බද්දේ ප්‍රතිදානයකට හිමිකම් පෑ හැකි භාණ්ඩයක් වශයෙන්, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින් ගැසට් කරන ලද භාණ්ඩයක් සම්බන්ධයෙන් පිරිවැටුම් බද්ද ගෙවනු ලැබුවේ නම්, ඒ කාලය සඳහා අපනයනකරුවකුට අදළ නොවන්නේ ය ; තවද

(ආ) ඒ උපවගන්තිවල සඳහන් භාණ්ඩයක් අපනයනය කරනු ලබන්නේ යම් භාජනයක, දරනයක හෝ දවටනයක ද ඒ උපවගන්තිවල ඇති විධිවිධානවල '' භාණ්ඩය '' සම්බන්ධයෙන් වූ සියලු සඳහන් කිරීම් අවස්ථාවෝචිත පරිදි, ඒ භාජනය, දරනය හෝ දවටනය සම්බන්ධයෙන් සඳහන් කිරීම් වුවාක් මෙන් ඒ ආකාරයෙන්ම අදළ වන්නේ ය.''.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උප වගන්තියේ අතුරු වගන්තියෙහි '' රුපියල් ලක්ෂ පහක් '' යන වචන වෙනුවට, '' රුපියල් ලක්ෂ එකක් '' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ—

(අ) ඒ උපවගන්තියේ (ii) වන ඡේදයෙහි ''සේවාවන් සැපයීම සඳහා වූ යම් ගිවිසුමක් ; හෝ '' යන යෙදුම වෙනුවට, '' සේවාවන් සැපයීම සඳහා වූ ගිවිසුමක් '' ; යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියේ (iii) වන ඡේදයෙහි '' (i) හෝ (ii) ඡේදයෙහි සඳහන් යම් ගිවිසුමක් සම්බන්ධයෙන් වූ අනුගිවිසුමක් '' යන යෙදුම වෙනුවට, '' (i) වන හෝ (ii) වන ඡේදවල සඳහන් යම් ගිවිසුමක් සම්බන්ධයෙන් වූ අනු ගිවිසුමක් ; හෝ '' යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(ඇ) ඒ උපවගන්තියේ (iii) වන ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අළුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

'' (iv) ප්‍රසංගකරුවකුගේ හෝ කලා ශිල්පියකුගේ සේවාවන්ට අදාළ වන්නා වූ හෝ උපදේශක සේවාවන්ට අදාළ වන්නා වූ යම් ගිවිසුමක්.''.

**8.** (1) මේ පනතේ 5 වන වගන්තිය සහ 6 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය 1981 නොවැම්බර් 12 වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

(2) (1) වන උපවගන්තිය ක්‍රියාත්මක කිරීමේ හේතුවෙන් යම් බද්දක් ගෙවිය යුතු වන අවස්ථාවක, ඒ බද්ද, මේ පනත ආරම්භවීමේ දින සිට මාස තුනක් ඇතුළත ගෙවනු ලැබිය යුතුය. එසේ නොගෙවන ලද යම් බද්දක් ගෙවීම පැහැර හරින ලද බද්දක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ බද්ද ගෙවනු ලැබිය යුත්තේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා හෝ එක් තැනැත්තකුට වැඩි දෙනෙකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ ගෙවිය යුතුව ඇති අවස්ථාවක, ඒ තැනැත්තන්ගෙන් එක් එක් තැනැත්තා සහ හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරු මේ පනතේ කාර්ය සඳහා ගෙවීම පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

## 1983 අංක 43 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 1983 ඔක්තෝබර් මස 19 වන දින]**

**1979 අංක 28 දරණ දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1983 අංක 43 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (මෙහි මින් මතු '' ප්‍රධාන ප්‍රඥප්තිය '' යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරණ දේශීය ආදායම් පනතේ 8 වන වගන්තියේ (අ) ඡේදය අගට පහත දැක්වෙන අනුඡේද එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'' (xli) 1981 අංක 74 දරණ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සහ ඒ පනතින් හෝ ඒ පනත යටතේ පිහිටුවන ලද යම් උසස් අධ්‍යාපන ආයතනයක් ;

(xlii) 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල පනතින් පිහිටුවන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල ;

(xliii) ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනය.''.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ (උ) ඡේදයේ " ලෝක සංචාරක සංවිධානය " යන වචන වෙනුවට "ලෝක සංචාරක සංවිධානය, ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනය හෝ කොළඹ ක්‍රමය කාර්යාංශය " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ (ඕ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

" (ඕ) ශ්‍රී ලංකාවේ වාසික යම් පුද්ගලයකු විසින් හෝ යම් පුද්ගලයකුට, යම් තක්සේරු වර්ෂයක් තුළ ශ්‍රී ලංකාවෙන් පිටත කරගෙන යනු ලබන හෝ පවත්වා ගෙන යනු ලබන යම් සේවා නියුක්තියක දී—

(අ) ඔහු විසින් ඒ තක්සේරු වර්ෂය තුළ දී කරන ලද සේවාවන් ; හෝ

(ආ) ඔහු විසින් හෝ ඔහුගේ හෝ ඇයගේ ස්වාමි පුරුෂයා හෝ භාර්යාව විසින් කරන ලද පසුගිය සේවාවන්

සම්බන්ධයෙන් විදේශීය ව්‍යවහාර මුදලින් උපයන ලද පඩි නඩි හෝ ඔහුට හෝ ඔහුගේ හෝ ඇයගේ ස්වාමි පුරුෂයාට හෝ භාර්යාවට අත්වන විශ්‍රාම වැටුප ඒ පුද්ගලයාට ශ්‍රී ලංකාවේ දී ගෙවනු ලබන්නේ නම් හෝ ඒ පඩි නඩි හෝ විශ්‍රාම වැටුප, (සාධාරණ වියදම් යයි කොමසාරිස් ජනරාල්වරයා සලකන, ඒ පුද්ගලයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී වියදම් කරන ලද යම් මුදලක් අඩුකර) ඔහු විසින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන්නේ නම්, ඒ පඩි නඩි හා විශ්‍රාම වැටුප ;" .

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (ඕ) ඡේදය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) යම් සමාගමක ලාභ සහ ආදායමින් යම් කොටසක්, මේ වගන්තිය අදාළ විය යුතු ව්‍යාපාරයක් බවට, ගැසට් පත්‍රයෙහි පළ කරන ලද දැන්වීමකින් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද්ද වූ යම් ව්‍යාපාරයක අපනයන ලාභවලින් සහ ආදායමෙන් සමන්විත වන්නේ ද, ඒ කොටස ;

(අ) 1972 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව සංස්ථාගත කරන ලද සහ 1978 නොවැම්බර් මස 15 වන දිනට පෙරාතුව, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 7අ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද සමාගමක් සම්බන්ධයෙන් වූ විට, ඒ සමාගම සංස්ථාගත කරන ලද දින සිට ගණන් ගනු ලබන අවුරුදු 8 ක කාලසීමාවක් සඳහා ද ;

(ආ) (i) යම් වෙළෙඳ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා 1972 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු සංස්ථාගත කරන ලද සහ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයක් මගින් 1978 නොවැම්බර් මස 15 වන දිනට පසු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ; හෝ

(ii) විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම පිණිස සේවා සැපයීම සඳහා 1972 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු සංස්ථාගත කරන ලද සහ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් 1978 නොවැම්බර් මස 15 වන දිනට පසු එහෙත් 1983 මාර්තු මස 31 වන දිනට පෙරාතුව අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද

සමාගමක් සම්බන්ධයෙන් වූ විට, ඒ සමාගම විසින් එහි ප්‍රථම අපනයනයන් කළ දිනයේ සිට නැතහොත් විදේශ විනිමයෙන් ගෙවීම පිණිස ඒ සමාගම විසින් සේවා සැපයීම ආරම්භ කරනු ලැබුවේ යම් දිනයක සිට ද ඒ දිනයේ සිට ගණන් ගනු ලබන අවුරුදු 5 ක කාලයක් සඳහා ද,

අදායම් බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය :

එසේ වුවද යම් සමාගමක් විසින් කරගෙන යනු ලබන යම් ව්‍යවසායක්—

(i) ඒ ව්‍යවසාය, වෙළෙඳ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා හෝ විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම පිණිස සේවාවන් සැපයීම සඳහා හෝ කලින් පැවති යම් ව්‍යාපාරයක් කොටස් කිරීමෙන් හෝ ප්‍රතිසංස්කරණය කිරීමෙන් පිහිටුවනු ලැබූ ව්‍යවසායක් නම් ;

(ii) ඒ ව්‍යවසායේ අපනයන පිරිවැටුමේ යම් කොටසක් වෙනත් යම් ව්‍යවසායක සම්පූර්ණ වෙළෙඳාම හෝ ව්‍යාපාරය හෝ එහි යම් කොටසක් හෝ ඒ ව්‍යවසායේ වෙළෙඳාම හෝ ව්‍යාපාරය සමග ඒකාබද්ධ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවූවක් නම්

ඒ සමාගම විසින් කරගෙන යනු ලබන ඒ ව්‍යවසාය සම්බන්ධයෙන් ඒ සමාගමට මේ උපවගන්තිය අදාළ නොවිය යුතුය'' ; තව ද

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි (ආ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

'(ආආ) '' නිෂ්පාදනය කිරීම '' යන්න, 1983 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් යෙදෙන විට, පලතුරු, එලවළු, මල් හෝ අලංකාරයට වවන පැලෑටි ද ඊට ඇතුළත් වේ. '.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඇ වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 22ඇඇ වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය :—

22ඇඇ. (1) (i) රජය සහ යම් රාජ්‍ය සංස්ථාවක් විසින් නැතහොත් යම් සංස්ථාගත මණ්ඩලයක් විසින් ස්වකීය ප්‍රාග්ධනයෙන් සියයට අනූපහකට නො අඩු මුදලින් හෝ අන්‍යාකාරයකින් දායක වූ ප්‍රාග්ධනය ඇතිව 1983 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව සංස්ථාගත කරනු ලැබූ ; සහ

(ii) ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද වෙනත් පොදු සමාගම්වල කොටස් මිලට ගැනීම සහ විකිණීම මූලික අරමුණ වූ

යම් පොදු සමාගමක ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වන්නාවූ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට යටත් පිරිසෙයින් අවුරුදු පහක කාලයක් සඳහා ඒ සමාගම විසින් රඳවා ගනු ලබන්නේ නම්, ඒ ලාභ සහ ආදායම, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, ආදායම් බද්දෙන් නිදහස් විය යුතුය.

(2) ඒ උපවගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ, යම් සමාගමක් විසින් රඳවා ගනු ලැබූ ලාභ සහ ආදායම, ඒ සමාගම සංස්ථාගත කිරීමේ දිනයට ඉක්බිතිව ම එළඹෙන මාර්තු මාසයේ තිස්එක් වන දිනයට ඒ සමාගමේ ගෙවා නිම කළ ප්‍රාග්ධනය මෙන් දෙගුණයකට සමාන මුදලක් වන විට, (1) වන උපවගන්තියෙහි සඳහන් නිදහස් කිරීම අවසන් විය යුතුය.

(3) යම් තක්සේරු වර්ෂයකදී යම් සමාගමක් විසින් රඳවා ගන්නා ලද හා මේ වගන්තිය යටතේ ආදායම් බද්දෙන් නිදහස් කරන ලද ලාභ සහ ආදායමෙන් යම් කොටසක්, ඒ තක්සේරු වර්ෂය අවසානයේ සිට අවුරුදු පහක කාලයක් ඇතුළත ඒ සමාගමේ කොටස්කරුවන්ට බෙදා දෙනු ලබන්නේ නම්, එසේ බෙදා දෙන ලද ලාභ සහ ආදායම මත ඒ තක්සේරු වර්ෂය සඳහා සමාගම විසින් ආදායම් බදු ගෙවනු ලැබිය යුතු අතර මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඒ බද්ද තක්සේරු කරනු ලැබිය යුතු ය ; ගෙවනු ලැබිය යුතුය ; අය කර ගනු ලැබිය යුතු ය.''.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. :—

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි ''මේ පනතේ 16 වන වගන්තිය යටතේ '' යන යෙදුම වෙනුවට ''මේ පනතේ 16 වන වගන්තිය හෝ 16අ වගන්තිය, හෝ 22අ වගන්තිය හෝ 22ආ වගන්තිය හෝ 22ඇ වගන්තිය හෝ 22ඈ වගන්තිය හෝ 22ඇඇ වගන්තිය යටතේ '' යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

' (4අ) නිදහස් කරනු ලැබූ කාලය අවසන් වන්නේ යම් තක්සේරු වර්ෂයක් අතර තුරදී ද, ඒ තක්සේරු වර්ෂය සඳහා 16ආ වගන්තියේ හෝ 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි සඳහන් ව්‍යවසායක් පවත්වා ගෙන යන තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායම් ආගණනය කිරීමේ දී—

(i) යම් පාඩුවක් දරනු ලැබූ යම් ගණන් තැබීමේ කාලයකට පසුව එළඹෙන, යම් ගණන් තැබීමේ කාලයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබූ ඒ ව්‍යවසායේ යම් ලාභවල සහ ආදායමේ ; සහ

(ii) (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ඒ තැනැත්තාගේ මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන් අඩු කරනු ලැබූ ඒ ව්‍යවසායෙහි දරන ලද යම් පාඩුවල යම් කොටසේ

සමස්තය එයින් අඩු කිරීමෙන් පසුව නිදහස් කරන ලද කාලය තුළ දරන ලද පාඩුවල මුළු එකතුව අඩු කරනු ලැබිය යුතු ය.

මේ උපවගන්තියෙහි '' නිදහස් කරනු ලැබූ කාලය '' යන්න 16ආ වගන්තියේ හෝ 20 වන වගන්තියේ (i) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ සඳහන් ව්‍යවසායක් සම්බන්ධයෙන් යෙදෙන විට ඒ ව්‍යවසායේ ලාභ සහ ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබුවේ යම් කාලයක් තුළ ද ඒ කාලය ඉන් අදහස් වේ. '.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි—

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

''(ආ) (i) ශ්‍රී ලංකා ආණ්ඩුවට ;

(ii) පළාත් පාලන ආයතනයකට ;

(iii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලදැයි සලකනු ලබන යම් උසස් අධ්‍යාපන ආයතනයකට ;

(iv) 1981 අංක 74 දරන බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනතින් පිහිටුවන ලද බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට සහ ඒ පනතින් හෝ ඒ පනත යටතේ පිහිටුවන ලද යම් උසස් අධ්‍යාපන ආයතනයකට ;

(v) ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලකට ;

(vi) පළාත් පාලන ආයතනයක් විසින් පිහිටුවනු ලැබ, අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අරමුදලකට

මුදලින් හෝ අන්‍යාකාරයකින් කරන ලද ත්‍යාගයක් ;''.

(ආ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයෙහි '' ලැබුවේ යයි ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් සහතික කරනු '' යන වචන අස්කිරීමෙන් ;

(ඇ) ඒ උපවගන්තියේ (ඌ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

'' (ඌඌ) 23 වන වගන්තිය යටතේ යම් දීමනාවක් ප්‍රදානය කොට ඇත්තේ යම් වාරිකයක් සම්බන්ධයෙන් ද එවැනි වාරිකයක් නොවන, කැරළි හෝ මහජන කැළඹීම්වලින් සිදුවන හානිවලට ප්‍රතිපක්ෂ රක්ෂණ ඔප්පුවක් මත පුද්ගලයකු විසින් ගෙවන ලද යම් වාරිකයක් ; ''

(ඈ) ඒ උපවගන්තියේ (ක) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්:—

'(ක) ප්‍රාග්ධනය රුපියල් කෝටි පනහක් ඉක්මවන්නාවූ සමාගමක් වන—

(i) 16අ වගන්තිය හෝ 22 ඈ වගන්තිය යටතේ 1983 මාර්තු මස 31 වන දිනට පෙරාතුව අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ; හෝ

(ii) 22ආ වගන්තිය යටතේ 1983 මාර්තු මස 31 වන දිනට පෙරාතුව අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් ව්‍යාපෘතියක යෙදී සිටින

සමාගමක පවත්නා කොටස් නොවන, සාමාන්‍ය කොටස් මිලට ගැනීමේ දී යම් තැනැත්තකු විසින් ආයෝජනය කරන ලද යම් මුදලක් ;

මේ ඡේදයේ කාර්ය සඳහා ''ප්‍රාග්ධනය '' යන්නෙහි, 18 වන වගන්තියේ (5) වන උපවගන්තියෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය. ;

(ග) විදේශ අධිකාරියෙන් හෝ ආණ්ඩුවේ යම් අරමුදලකින් ප්‍රදානයක් වශයෙන් ලැබුනු මුදලක් හෝ කැරලි හෝ මහජන කැළඹීම් වලින් සිදුවන හානි හෝ විනාශ කිරීම් වලට ප්‍රතිපක්ෂ රක්ෂණ ඔප්පුවක ලැබීම්වලින් ලැබුණු මුදලක් හෝ නොවන නැතහොත් 23 වන වගන්තිය යටතේ යම් දීමනාවක් ප්‍රදානය කොට ඇත්තේ යම් මුදලක් සම්බන්ධයෙන් ද එවැනි මුදලක් නොවන, 1983 ජූලි මස 24 වන දිනට පසුව සහ 1983 අගෝස්තු මස 24 වන දිනට පෙර කැරළි වලින් හෝ මහජන කැළඹීම් වලින් හානියට හෝ විනාශයට පත් යම් නිශ්චල දේපලක් අළුත්වැඩියා කිරීම මත හෝ පුනස්ථාපනයට පත්කිරීම මත යම් තැනැත්තකු විසින් වියදම් කරනු ලැබුවේ යැයි මහජන ආරක්ෂක ආඥාපනත යටතේ පිහිටුවන ලද විදේශ අධිකාරිය විසින් හෝ විදේශ අධිකාරියට සමාන කර්තව්‍ය ඉටුකරන ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් විසින් හෝ සහතික කරන ලද යම් මුදලක්

අදහස් වේ. '.

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි—

(අ) ''වර්ෂ හතරකට වැඩි නොවන්නා වූ '' යන වචන වෙනුවට '' වර්ෂ දහහතරකට වැඩි නොවන්නා වූ '' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) '' වර්ෂ පහක් ඉක්මවන '' යන වචන වෙනුවට '' වර්ෂ පහළොවක් ඉක්මවන '' යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ '' (2) වන උපවගන්තියේ (ආ), (ඇ) සහ (ක) ඡේදවල සඳහන් '' යන වචන වෙනුවට '' (2) වන උපවගන්තියේ (ආ), (ඇ), (ක) සහ (ග) ඡේදවල සඳහන් '' යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ (6) වන උප වගන්තියේ '' (2) වන උපවගන්නියේ (ආ), (ඇ) සහ (ක) ඡේද වල සඳහන් '' යන වචන වෙනුවට '' (2) වන උපවගන්තියේ (ආ), (ඇ), (ක) සහ (ග) ඡේදවල සඳහන් '' යන වචන ආදේශ කිරීමෙන්.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (ප) සහ (බ) ඡේද පිළිවෙලින් ඒ වගන්තියේ (ම) සහ (ය) ඡේද වශයෙන් නැවත අක්ෂර යෙදීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (න) ඡේදයට ඉක්බිතිව ම, පහත දක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ප) 1980 අංක 46 දරන සේවානියුක්තයන්ගේ භාර අරමුදල පනතින් පිහිටුවන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල ;

(බ) ජාත්‍යන්තර වාරිමාර්ග කළමනාකරණ ආයතනය ;".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ "අධ්‍යාපන ආයතනයකට " යන වචන වෙනුවට " අධ්‍යාපන ආයතනයකට හෝ 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට සහ ඒ පනතින් හෝ ඒ පනත යටතේ පිහිටුවන ලද යම් උසස් අධ්‍යාපන ආයතනයකට " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියේ (1අ) උප වගන්තියේ " හෝ ඒ වර්ෂයේ අප්‍රේල් මස 1 වන දිනයෙහි එහි වෙළෙඳ අගය " යන යෙදුම වෙනුවට " හෝ ත්‍යාගයේ දිනයෙහි එහි වෙළෙඳ අගය " යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තියේ (5) වන උපවගන්තියේ දෙවන අතුරු වගන්තිය වෙනුවට, පහත දැක්වෙන අලුත් අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" එසේ වුවද, තක්සේරුකරුගේ මතය අනුව, යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු යම් ආදායම් බද්දක්, ධන බද්දක් හෝ ත්‍යාග බද්දක් සම්බන්ධයෙන් ඒ තැනැත්තා විසින් හෝ ඔහු වෙනුවෙන් යම් වංචාවක්, මගහැරීමක් හෝ උවමනාවෙන්ම පැහැර හැරීමක් සිදුකොට ඇති අවස්ථාවක ඒ තක්සේරු වර්ෂය අවසාන වීමෙන් පසු ඕනෑම අවස්ථාවකදී ඒ තැනැත්තා විෂයයෙහි තක්සේරුකරු විසින් තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් හෝ කිරීම නීත්‍යානුකූල වන්නේ ය. ".

**13.** 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය, 1983 අප්‍රේල් මස 1 වන දින බලාත්මක වූ ලෙස , සියළු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

**14.** ප්‍රධාන ප්‍රඥප්තිය අදාළ කිරීමේ කාර්ය සඳහා මහජන ආරක්ෂක ආඥාපනත යටතේ පිහිටුවන ලද විදේශ අධිකාරිය ආණ්ඩුවේ ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එහි අරමුදල ආණ්ඩුව විසින් පිහිටුවා පවත්වාගෙන යනු ලබන අරමුදලක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## 1983 අංක 51 දරන ලියාපදිංචි කළ ස්කන්ධ හා සුරැකුම්පත් (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 1983 දෙසැම්බර් මස 14 වන දින]**

**ලියාපදිංචි කළ ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

**1.** මේ පනත 1983 අංක 51 දරන ලියාපදිංචි කළ ස්කන්ධ හා සුරැකුම්පත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** ලියාපදිංචි කළ ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනතේ 33 වන වගන්තියට ඉක්බිතිව ම, ඒ ආඥාපනතේ 33අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් , ඒ ආඥාපනත මෙයින් සංශෝධනය කරනු ලැබේ. :—

33අ. (1) මේ ආඥපනතෙහි හෝ වෙනත් යම් නීතියක හෝ මේ ආඥපනතේ 4 වන වගන්තිය යටතේ පළ කරන ලද කිසියම් නියමයක හෝ කුමක් සඳහන්ව ඇත ද, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින් ප්‍රකාශයක් කිරීමෙන්, ඒ ප්‍රකාශයේ දින සිට, මේ ආඥපනත යටතේ ලබා ගන්නා ලද හෝ ලබා ගැනීමට යන හෝ කිසියම් ණය මුදලක් වෙනුවෙන් ජාතික ආර්ථිකයේ ආරක්ෂාව සඳහා, නිදන් අරමුදලට දයක මුදල් කිසිවක් නොගෙවිය යුතු යයි, ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයක් කරනු ලබන අවස්ථාවක, ඒ පරිණත ණය නිදහස් කිරීම සඳහා විසර්ජන පනතෙහි විධිවිධාන සලස්වනු ලැබිය යුතුය. ''.

## 1983 අංක 52 දරන විසර්ජන පනත

**[සහතිකය සටහන් කළේ 1983 දෙසැම්බර් මස 29 වන දින]**

**1984 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීමත්, එම සේවා වියදම් සඳහා ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් හෝ ණය ලබා ගැනීමට බලය දීමත්, ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ යම් යම් කටයුතු වෙනුවෙන් මුදල් සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ පනතකි.**

1. මේ පනත 1983 අංක 52 දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) යම් මුදලක් වැය කිරීමට බලය දෙන්නාවූ අන්කිසි නීතියකට හානියක් නොමැතිව, මේ පනතෙහි " 1984 මුදල් වර්ෂය " යනුවෙන් සඳහන් කරනු ලබන 1984 ජනවාරි මස 01 වන දිනයෙන් ආරම්භව 1984 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේයයි තක්සේරු කර ඇති රුපියල් හාර දහස් දහසය කෝටි හත් ලක්ෂ හැට හය දහසක් වූ ආණ්ඩුවේ වියදම—

(අ) ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම් වලින් ; හා

(ආ) ණය වශයෙන් ලබා ගන්නා මුදල්වල සමස්තය රුපියල් එක්දහස් නවසිය හැත්තෑ හතර කෝටියක් නොඉක්මවන සේ ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් හෝ ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල් වලින්

පියවිය යුතුය.

මෙහි ඉහත සඳහන් කළ රුපියල් හාර දහස් දහසය කෝටි හත්ලක්ෂ හැට හය දහසක් වූ මුදල මේ පනතේ පළමුවන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකිය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි විධිවිධාන, ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ණය ලබා ගැනීමට බලය දෙනු ලබන අන්කිසි ලිඛිත නීතියක විධිවිධානවලට හානියක් නොමැතිව බලපැවැත්විය යුතුය.

3. (1) 1984 මුදල් වර්ෂය තුළ දී, මෙම පනතෙහි දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන එක් එක් කටයුත්තෙන් ආණ්ඩුවට ලැබෙන ලැබීම් එම කටයුත්තේ ගිණුමට බැරකළ යුතු අතර, එසේ බැර කරනු ලැබූ ලැබීම්වල සමස්තය එම උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනෙහි දක්වෙන අවම සීමාවට අඩු නොවිය යුතුය. එවැනි කටයුත්තකින් ලබන ශුද්ධ අතිරික්තයක් වේ නම්, පහත දක්වෙන ගෙවීම් එවැනි කටයුත්තක ආදායමින් අඩු කිරීමෙන් පසුව, එනම් :—

(අ) කිසියම් කටයුත්තක ආදායමට අය විය යුතුව, නිසි අයුරින් ගෙවනු ලැබූ හෝ උපචිත වූ එම කටයුත්තේ කාර්ය සාධන, සංස්ථාපන හා වෙනත් වියදම් ; සහ

(ආ) කිසියම් කටයුත්තක නිශ්චල හා චංචල දේපළ වෙනුවෙන් ක්ෂයවීම ආවරණය සඳහා ප්‍රතිපාදන

1984 මුදල් වර්ෂය අවසන්වී හය මාසයක් ඉකුත්වීමට පෙර ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතුය.

(2) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන්, 1984 මුදල් වර්ෂය තුළ ආණ්ඩුව විසින් දරනු ලබන වියදම්, ඒ මුදල් වර්ෂය තුළ දී එම කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම්වලින් ගෙවිය යුතු ය. එහෙත් එම වියදම් එම උපලේඛනයේ II වන තීරයෙහි අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය.

(3) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන කිසියම් කටයුත්තක් සම්බන්ධයෙන්, 1984 මුදල් වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය, එම උපලේඛනයේ IV වන තීරයෙහි අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතුය. තවද, ඒ මුදල් වර්ෂයේ අවසානයේ දී එම කටයුත්තේ මුළු බැරකම්, එම උපලේඛනයේ V වන තීරයෙහි අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්ම විය යුතුය.

4. 1984 මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන යම් කටයුත්තකින් ආණ්ඩුවට ලැබෙන ලැබීම්, ඒ කටයුත්ත සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරණ ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, එම වියදම් පියවීම සඳහා අමාත්‍යවරයා අවශ්‍ය යයි සලකන මුදල්, ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි හෝ වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතු යයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කරනු ලැබිය හැකිය. එහෙත් එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල සමස්තය එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ දක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතුය. එකී කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක්, අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවිය යුතුය.

5. (1) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් කිසියම් ශීර්ෂයක් යටතේ දක්වෙන යම්කිසි වැඩ සටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම් වලට ඒ උපලේඛනයෙහි විධිවිධාන ප්‍රකාර, වෙන් කරනු ලැබුවා වූ ද, එහෙත් වියදම් නොකරන ලද්දා වූ හෝ මතුවට වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තු විය හැකි වූ ද, යම් මුදලක් එම වැඩ සටහනේම මූලධන වියදමේ වෙන් කිරීමකට හෝ එම ශීර්ෂයේම වෙන යම් වැඩ සටහනක් යටතේ පුනරාවර්තන වියදමේ හෝ මූලධන වියදමේ හෝ වෙන් කිරීමකට හෝ භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකුගේ හෝ නියමය අනුව මාරු කළ හැකිය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයේ සඳහන් යම් ශීර්ෂයක් යටතේ දක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ මූලධන වියදමට වෙන් කරන ලද කිසිම මුදලක් ඒ වෙන්කිරීමෙන් පිටතට මාරු කරනු නොලැබිය යුතුය.

**6.** (1) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදු වලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම්, බලාපොරොත්තු වූ මුදල් ප්‍රමාණ වලට වඩා අඩු විය හැකි බවට ; හෝ

(2) යම් කිසි කාර්යයක් හෝ කාර්යයන් සඳහා මුලින් විසර්ජිත මුදල් තව දුරටත් අවශ්‍ය නොවන බවට,

අමාත්‍යවරයා සෑහීමකට පත්වූ අවස්ථාවක, ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදාහරින ලද මුදල් සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ ඉවත් කර ගැනීම අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමතය ඇතිව කරනු ලැබිය හැකිය.

**7.** අමාත්‍යවරයා විසින්, ආණ්ඩුවේ අනුමතය ඇතිව—

(අ) මේ පනතේ දෙවන උපලේඛනයේ II වන තීරයෙහි, IV වන තීරයෙහි සහ V වන තීරයෙහි දක්වෙන උපරිම සීමා කිසිවක් ;

(ආ) මේ පනතේ දෙවන උපලේඛනයේ III වන තීරයෙහි දක්වෙන අවම සීමා නියමයක් මගින් 1985 මැයි මස 31 වන දින හෝ එදිනට පෙර හෝ වෙනස් කිරීම හෝ අමුතු කිරීම හෝ කරනු ලැබිය හැකිය.

එවැනි කිසියම් නියමයක්, එහි එසේ ප්‍රකාශිතව සඳහන් කරනු ලැබුවහොත්, ඒ නියමය කරනු ලැබූ දිනයට කලින් වූ සහ එහි දක්වනු ලබන දිනයක සිට බලපැවැත්වූ ලෙස සැලකිය යුතුය.

**8.** පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් මේ පනතේ දෙවන උපලේඛනයෙහි උචිත තීරවලට යම් කටයුත්තක් එකතු කිරීමෙන් සහ—

(අ) එම කටයුත්ත සම්බන්ධයෙන් වූ සියළුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක් ;

(ආ) එම කටයුත්ත සම්බන්ධයෙන් වූ අවම සීමාව

එකතු කිරීමෙන් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකිය.

## 1983 අංක 53 දරන පුනරුත්ථාපන බදු පනත

**[සහතිකය සටහන් කළේ 1983 දෙසැම්බර් මස 29 වන දින]**

**1984 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන ලිත් වර්ෂය වෙනුවෙන් නිශ්චිත සේවා නියුක්තයන් සම්බන්ධයෙන් පුනරුත්ථාපන බද්දක් පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

**1.** මේ පනත 1983 අංක 53 දරන පුනරුත්ථාපන බදු පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** 1984 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන ලිත් වර්ෂයෙහි සෑම මාසයක් සඳහාම, සෑම නිශ්චිත සේවා නියුක්තයකු සම්බන්ධයෙන්ම, එම මාසය සඳහා එම සේවා නියුක්තයාගේ පඩිනඩිවලින් සියයට එකක ප්‍රමාණයක (මෙහි මින් මතු " බද්ද " යනුවෙන් සඳහන් කරනු ලබන) පුනරුත්ථාපන බද්දක් අය කරනු ලැබිය යුතු ය.

**3.** සෑම නිශ්චිත සේවා නියුක්තයකුගේම සේවා යෝජක විසින්, කිසියම් මාසයක් සඳහා එම නිශ්චිත සේවා නියුක්තයා විසින් ගෙවනු ලැබිය යුතු බද්ද, එම බද්ද ගෙවනු ලැබිය යුතු මාසයට ඉක්බිතිව ම එළඹෙන මාසයෙහි පහළොස්වන දින හෝ එදිනට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

**4.** 1984 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ වන ලිත් වර්ෂයෙහි කිසියම් මාසයක් වෙනුවෙන් යම් නිශ්චිත සේවා නියුක්තයකු විසින් ගෙවනු ලැබිය යුතු බද්ද, ඒ මාසය සඳහා එම සේවා නියුක්තයාට ගෙවනු ලැබිය යුතු පඩිනඩිවලින් අඩුකර ගැනීමට නිශ්චිත සේවා නියුක්තයකුගේ සෑම සේවා යෝජකයකු ම හිමිකම් ලබන්නේ ය.

**5.** නිශ්චිත සේවා නියුක්තයකුගේ සේවා යෝජක විසින්, එම සේවා නියුක්තයා විසින් කිසියම් මාසයක් සඳහා ගෙවනු ලැබිය යුතු බද්ද, 3 වන වගන්තියට අනුකූලව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවක, එම බද්දෙහි ප්‍රමාණය එම සේවා යෝජක ගෙන් අයකර ගනු ලැබිය හැකි ය. 1979 අංක 28 දරණ දේශීය ආදායම් පනතේ 107 වන, 108 වන, 109 වන සහ 110 වන වගන්තිවල හා XXI වන පරිච්ඡේදයේ විධිවිධාන, බද්ද තක්සේරු කිරීම, ගෙවීම හා අයකරගැනීම සම්බන්ධයෙන් ද, බද්ද ගෙවීම පැහැර හැරීම සඳහා වූ දණ්ඩන සම්බන්ධයෙන් ද අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

**6.** කිසියම් මාසයක් සඳහා නිශ්චිත සේවා නියුක්තයකු විසින් ගෙවනු ලැබිය යුතු බද්ද එම සේවා නියුක්තයාගේ සේවා යෝජක විසින් ගෙවනු ලබන නමුත්, එම බද්දේ ප්‍රමාණය එම මාසය සඳහා වූ එම සේවා නියුක්තයාගේ පඩිනඩිවලින් අඩු කරගනු නොලබන අවස්ථාවක, එම බද්දේ ප්‍රමාණය—

(අ) 1979 අංක 28 දරණ දේශීය ආදායම් පනත යටතේ එම සේවා යෝජකගේ ලාභ සහ ආදායම් නිසැකව දැනගැනීමේ කාර්ය සඳහා අඩු කිරීමක් වශයෙන් සැලකීමට ඉඩ දෙනු නොලැබිය යුතු ය ; තව ද

(ආ) ඒ පනත යටතේ එම සේවා නියුක්තයාගේ ලාභ සහ ආදායම් නිසැකව දැන ගැනීමේ කාර්ය සඳහා ඔහුගේ ලාභ සහ ආදායමේ කොටසක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

**7.** (1) මේ පනත ආරම්භ වන දිනයේ දී නිශ්චිත සේවා නියුක්තයකු තම සේවයෙහි නියුක්ත කර ගෙන ඇති සෑම සේවා යෝජකයකු විසින් ම , එවැනි සේවා නියුක්තයකු තම සේවයෙහි නියුක්ත කර ගෙන ඇති බවට 1984 ජනවාරි මස 15 වන දින ඉකුත්වීමට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැන්වීමක් කළ යුතු ය.

(2) සේවා යෝජකයකු විසින්, මේ පනත ආරම්භ වන දිනයෙන් පසුව යම් නිශ්චිත සේවා නියුක්තයකු සේවයෙහි නියුක්ත කර ගැනීම ආරම්භ කරනු ලබන අවස්ථාවක, එම සේවා නියුක්තිය ආරම්භ කර එක් මාසයක් ඇතුළතදී, එවැනි සේවා නියුක්තයකු තම සේවයෙහි නියුක්ත කරගෙන ඇති බවට ඒ සේවා යෝජක විසින් කොමසාරිස් ජනරාල්වරයාවෙත දැන්වීමක් කළ යුතු ය.

(3) කොමසාරිස් ජනරාල්වරයා වෙත දැන්වීමක් කිරීමට මේ වගන්තිය මගින් තමා වෙත පනවා ඇති නියමය අනුව ක්‍රියා කිරීම පැහැර හරින සෑම සේවා යෝජකයකු ම, ඔහු විසින් එම දැන්වීම දීමට නියමිත දිනයේ සිට එක් මාසයක් ඇතුළත දී, රුපියල් පන්දහසක දඩයක් ගෙවීමට යටත් විය යුතුය. නොගෙවන ලද කිසියම් දඩ මුදලක් අයකර ගැනීම සම්බන්ධයෙන්, එම දඩය මේ පනත යටතේ ගෙවිය යුතු බද්දක් වූ පරිද්දෙන්, 5 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

**8.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

''දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා '' යන්නෙහි , 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

'' පඩිනඩි '' යන්න, නිශ්චිත සේවා නියුක්තයකු සම්බන්ධයෙන් යෙදෙන විට, 1979 අංක 28 දරණ දේශීය ආදායම් පනතේ 4 වන වගන්තියේ (අ) ඡේදයේ (i) වන අනුඡේද යෙහි සඳහන් පරිදි ඒ සේවා නියුක්තයාගේ කිසියම් සේවා නියුක්තියකින් හෝ පූර්ව සේවා නියුක්තියකින් වූ ලාභ අදහස් වන නමුත්, ඒ පනතේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඒ) ඡේදයෙහි හෝ (ඔ) ඡේදයෙහි සඳහන් දීමනා හෝ පඩිනඩි කිසිවක් ඊට ඇතුළත් නොවේ ;

'' සේවා යෝජක '' යන්නෙහි, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 113 වන වගන්තියෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය ;

'' නිශ්චිත සේවා නියුක්තයා '' යන්නෙන්, 1979 අංක 28 දරණ දේශීය ආදායම් පනතේ 4 වන වගන්තියේ අර්ථානුකූලව, කිසියම් සේවා නියුක්තියකින් හෝ පූර්ව සේවා නියුක්තියකින් ලාභ ලබන්නා වූ ද—

(අ) ඒ පනතේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි හෝ (ආ) ඡේදයෙහි සඳහන් තැනැත්තකු ; හෝ

(ආ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් පිහිටුවන ලද සේවක අර්ථ සාධක අරමුදලට හෝ 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ එවැනි යම් වියමත් අර්ථ සාධක අරමුදලකට හෝ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද අර්ථ සාධක අරමුදලකට හෝ දායක මුදලක් ගෙවනු ලබන්නේ යම් තැනැත්තකු වෙනුවෙන් ද, එවැනි තැනැත්තකු ; හෝ

(ඇ) 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු වගන්තිය ප්‍රකාර සේවක අර්ථසාධක අරමුදලට දායක මුදලක් ගෙවනු ලැබිය යුතු නොවන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද එවැනි තැනැත්තකු ; හෝ

(ඈ) සමාගමක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ අධ්‍යක්ෂවරයකු නැතහොත් හවුල් ව්‍යාපාරයක ක්‍රියාකාරී හවුල්කරුවකු

වන්නාවූ ද යම් තැනැත්තකු අදහස් වන නමුත්, ශ්‍රී ලංකාවෙහි පුරවැසියෙකු නොවන්නා වූ ද, 1979 අංක 28 දරණ දේශීය ආදායම් පනතේ 9 වන වගන්තියේ (2) වන උප වගන්තියෙහි සඳහන් තැනැත්තකු නොවන, ඒ පනතේ 9 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඇ) සිට (ළු) තෙක් වූ ඡේද හෝ (ඔබ) ඡේදය හෝ යටතේ සේවා නියුක්තියෙන් ලබන ලාභ, ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබ සිටින තැනැත්තකු වන්නාවූ ද යම් තැනැත්තෙක් ඊට ඇතුළත් නොවේ.